7 හැවිරිදි සිසුවියක් ලිංගික අපරාධයකට ලක්ව මියයෑම සම්බන්ධ ප්‍රවෘත්තිය පසුගිය දිනවල බොහෝ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ අතර, එම පුවත ඇතැම් මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කොට තිබූ ආකාරය සම්බන්ධයෙන් විවේචනයන්ද සමාජ මාධ්‍ය ඔස්සේ එල්ල වී තිබිණි.

ලිංගික අපරාධයකට ලක්වූවෙකුගේ අනන්‍යතාවය හෙළි නොකරන ලෙසින් මාධ්‍ය ආචාර ධර්මයන් ඔස්සේ මාධ්‍යවේදීන්ට උපදෙස් ලබාදේ. ලිංගික අපරාධයකට ලක්වූ වින්දිතයා මියගොස් සිටිනා අවස්ථාවකදී වුවද, වින්දිතයාගේ ඡායාරූපයන් මාධ්‍ය ඔස්සේ පළ වීම මගින්, වින්දිතයාගේ පවුලේ අයවලුන් සිත්වේදනාවන්ට ලක් වීමේ ඉඩක් පවතින බව අමතක කළ හැකි නොවේ.

විවිධ රූපවාහිනී නාලිකාවන්හි ප්‍රවෘත්ති විකාශයන් මෙම සිදුවීම වාර්තා කර තිබුණේ මෙසේයි:

1) හිරු ටීවී පුවත් විකාශය තුළ ලිංගික අපරාධයකට ලක්ව මියගිය සිසුවියගේ ඡායාරූප කිහිපයක්ම කිසිදු බොඳ කිරීමකින් හෝ තොරව පෙන්වා තිබූ අතර, ඇයගේ අනන්‍යතාවයද හෙළිකොට තිබිණි. හිරු ටීවී පුවත් විකාශය ඔස්සේ සිසුවියගේ ආවරණය කර ඇති මෘතදේහයද පෙන්වයි.

2) අද දෙරණ පුවත් විකාශය මගින් සිසුවියගේ ඡායාරූපය කළු කොටුවකින් ඇස් වසා ඉදිරිපත් කරන අතර, ඇයගේ අනන්‍යතාවය හෙළිදරව් කරයි.

3) ස්වර්ණවාහිනී මගින් සිසුවියගේ ඡායාරූපයක් බොඳ කිරීමකින් යුතුව පෙන්වා සිටින අතර, ඇගේ අනන්‍යතාවය හෙළි නොකරයි.

4) අයිටීඑන් පුවත් විකාශය මගින් සිසුවියගේ අනන්‍යතාවය හෙළි නොකරමින්, ඡායාරූප කිසිවක් නොපෙන්වමින් සිදුවීම වාර්තා කරන අතර, ඇගේ ආවරණ කර ඇති මෘතදේහය හා එය ගෙන යන ආකාරයද බොඳ කොට පෙන්වයි.

මෙවන් පුවතක් පළ කිරීමේදී ජනමාධ්‍ය ආචාර ධර්මානුකූලව, වගකීම් සහගතව කටයුතු කල යුතු බව නැවත නැවතත් අපි අවධාරණය කරමු.
අදාළ පුවත් විකාශයන් මෙතැනින්:

හිරු ටීවී: https://youtu.be/swKnN9TNiaI?t=1776

අද දෙරණ: https://youtu.be/Q2lEqTwqxkg?t=517

ස්වර්ණවාහිනී: https://youtu.be/45qw6OI62AY?t=1777

ස්වාධීන රූපවාහිනී: https://youtu.be/Ocyb6MAQjtk?t=2155

වැඩිදුර කියැවීම් සඳහා:
https://www.unicef.org/afghanistan/sites/unicef.org.afghanistan/files/2018-03/afg-publication_UN%20Ethical%20Guidelines%20for%20Journalists%20-%20English.pdf
https://www.ipso.co.uk/member-publishers/guidance-for-journalists-and-editors/guidance-on-reporting-of-sexual-offences/

#MediaEthics #lka #SinhalaNews #TVchannels #TVDerana #HiruTV #ITN #Swarnavahini